ප්‍රධාන ප්‍රතිමිලදීගැනීම් ගිවිසුම

(ස්වකීය අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභීන් ඇතුලත් වන මෙහි මින්මතු **"අලෙවිකරු"** යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 40, නවම් මාවත, කොළඹ 2 යන ලිපිනයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තා වූද බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වන (ලියාපදිංචි කිරීමේ අංක **PQ27** දරන) සහ ශ්‍රී ලංකාවේ යථාපරිදි සංස්ථාගත කරන ලද බැංකු සමාගමක් වන **නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී** ආයතනයද;

ගනුදෙනුකරු තනිපුද්ගලයකු වේ නම්;

(ස්වකීය උරුමක්කරුවන්, අද්මිනිස්ත්‍රාසිකරුවන් සහ පැවරුම්ලාභීන් ඇතුළත් වන මෙහි මින්මතු **"ගනුදෙනුකරු"** යනුවෙන් සඳහන් කරනු ලබන) .... (ලිපිනය) පදිංචි ජා.හැ.පත් අංක .... දරන .... (ජා.හැ. පත්‍රයට අනුව නම) යන අයද,

ගනුදෙනුකරු සමාගමක් වේ නම්;

(ස්වකීය අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභීන් ඇතුළත් වන මෙහි මින්මතු **"ගනුදෙනුකරු"** යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ .... යන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය (ලියාපදිංචි ව්‍යාපාරික ලිපිනය) පිහිටා ඇත්තාවූද (ලියාපදිංචි අංක .... දරන) ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද සමාගමක් වන .... (සංස්ථා සහතික පත්‍රයට අනුව නම) යන ආයතනය ද (වෙන් වෙන් වශයෙන් "පාර්ශවයක්" සහ එක්ව ගත්කල "පාර්ශව" යනුවෙන් සඳහන් කරනු ලබන) අතර මෙම ගිවිසුමට ඇතුළත් වනු ලැබේ.

1. **අර්ථනිරූපනය**

මෙම ගිවිසුමේ කාර්ය සඳහා, පහත අර්ථ නිරූපිත යෙදුම් සඳහා පහත දැක්වෙන අර්ථයන් තිබිය යුත්තේ ය.

(අ) **"කඩිනම් දිනය"** යන්නෙන් මෙම ගිවිසුමේ නියමයන් ප්‍රකාරව ගිවිසුම අවසන්කිරීමේ නිවේදනය භාරදීමේ ප්‍රතිඵලයක් ලෙස සියලු ගනුදෙනුවල ප්‍රතිමිලදීගැනීම් සිදුවන දිනය වන්නා වූ ගිවිසුම අවසන්කිරීමේ නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති දිනය අදහස් වේ.

(ආ) **"බුන්වත්භාවය පිළිබඳ ක්‍රියාව"** යන්නෙන් යම් පාර්ශවයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, (i) සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ගෙවීම් කලයුතු දිනවල දී එම පාර්ශවයට ස්වකීය ණය ගෙවීමට නොහැකිවීම; (ii) එම පාර්ශවයේ හෝ එම් පාර්ශවයේ දේපළෙහි සැලකිය යුතු කොටසක් සඳහා භාරකරුවකු අද්මිනිස්ත්‍රාසිකරුවකු, ග්‍රාහකයකු, හෝ ඇවරකරන්නකු හෝ සාමාන නිලධරයකු පත්කිරීමට පාර්ශවය විසින් අපේක්ෂා කිරීම, ඒ සඳහා කැමැත්ත ලබාදීම හෝ අනුමත කිරීම; (iii) පාර්ශවයක බුන්වත්භාවය පිළිබඳ, ඈවර කිරීම පිළිබඳ හෝ වෙනත් යම් බංකොලොත්භාවයක් පිළිබඳ හෝ උද්දේශිත ලෙස යම් අධිකරණයක් හෝ නියෝජිත ආයතනයක් ඉදිරිපිට පෙත්සමක් ඉදිරිපත් කර තිබීම හෝ ගොනුකර තිබීම හෝ එම නඩු කටයුතු ගොනුකිරීමේ දින සිට දින තිහක් (30) ඇතුලත සාමාන නඩුකටයුතු නැවතී නොතිබීම හෝ නිශ්ප්‍රභ නොවී පැවතීම අදහස් වේ;

(ඇ) **"ගිවිසුම"** යන්නෙන්, ප්‍රධාන ප්‍රතිමිලදීගැනීම් ගිවිසුමේ කොටසක් සංයුක්ත වන සියලු ගනුදෙනු ද සමග එම ප්‍රධාන ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම අදහස් වේ.

(ඈ) **"සංශෝධිත ප්‍රතිමිලදීගැනීම් මිල"** යන්නට 7 වන වගන්තියේ පැහැරහැරීමේ අවස්ථාව/අවසන් කිරීමේ අවස්ථාව යන්නට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය;

(ඉ) **"ව්‍යාපාරික දිනය"** යන්නෙන් **අලෙවිකරු** සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු සඳහා විවෘතව පවතින දිනයක් අදහස් වේ.

(ඊ) **"CDS ගිණුම"** යන්නෙන් අදාල යෝග්‍ය සුරකුම්පත් දරනු ලබන හෝ උචිත පරිදි, දැරීමට නියමිත වන රජයේ සුරකුම්පත් සම්බන්ධයෙන් වන මධ්‍යම තැන්පතුගාර පද්ධතිය සමග පවතින ("ලංකා සෙක්‍යු") **ගනුදෙනුකරුගේ** ගිණුම අදහස් වේ.

(උ) **"තහවුරු කිරීම"** යන්නෙන් මෙහි I වන ඇමුණුමේ පෙන්වා දී ඇති ආකෘතියට සාරානුකූලව **"අලෙවිකරු"** විසින් නිකුත් කරනු ලබන තහවුරු කිරීමක් අදහස් වේ.

(ඌ) **"පැහැර හැරීමේ අනුපාතිකය"** යන්නෙන් ශ්‍රී ලංකා මහබැංකුව විසින් ස්වකීය වෙබ් අඩවියෙහි පළකරනු ලබන වාර්ෂික ස්ථාවර ණය පහසුකම් අනුපාතිකයට සියයට 2% ක් එකතු කිරීමෙන් ලැබෙන අනුපාතිකය අදහස් වේ. (9 වන වගන්තිය ප්‍රකාරව ප්‍රතිශෝධනය කරනු ලබන - මෙහි සඳහන් ප්‍රමාද ගෙවීම් මත වූ පොළිය);

(එ) **"2019 අංක 1 දරන නියෝගය"** යන්නෙන් ශ්‍රී ලංකා මහබැංකුවේ (CBSL) - මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන කලින්කල සංශෝධිත 2019 අංක 1 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරකුම්පත් ආඥාපනත් සහ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත් නියෝග අදහස් වේ.

(ඒ) **"අවමිල"** අවසාන කූපන්පත් ගෙවීම් දින සිට අදාල දිනය දක්වා අදාල සුරකුම්පත මත උපචිත වන පොළිය ඇතුලත් වන යෝග්‍ය සුරකුම්පත් මිල අදහස් වේ.

(ඔ) **"යෝග්‍ය සුරකුම්පත/සුරකුම්පත්"** යන්නෙන් රජය වෙනුවෙන් CBSL විසින් නිකුත් කරනු ලබන අතිරේක කොටස් මුදල් රහිත භාණ්ඩාගාර බැඳුම්කර සහ අතිරේක කොටස් මුදල් රහිත භාණ්ඩාගාර බිල්පත් හෝ ශ්‍රී ලංකා මහබැංකුව විසින් අනුමත කරනු ලබන වෙනත් යම් සුරකුම්පතක් අදහස් වේ.

(ඕ) **"සම සුරකුම්පත්"** යන්නෙන් 6 වන වගන්තිය ප්‍රකාරව මිලදීගත් සුරකුම්පත් ආදේශ කිරීමක් සිදුවන අවස්ථාවක දී - මීලදීගත් සුරකුම්පත්වල ස්වභාවයේම, සාමාන්‍ය වටිනාකමකින් යුත්, විස්තරයකින් සහ ගණනකින් යුත් සුරකුම්පත් ආදේශ කිරීමක් අදහස් වේ;

(ක) **"අදිසි තත්ත්වයක් නිසා ගිවිසුම සපුරාලීමට නොහැකිවීම"** යන්නෙන් (ප්‍රකාශිත හෝ ප්‍රකාශිත නොවන) යුද්ධයක් ඇතිවීම, පසමිතුරුකම් ආක්‍රමණය, විදේශී සතුරු ක්‍රියා, ව්‍යාප්ත සන්නද්ධ හමුදා කටයුතු, සිවිල් යුද්ධ, කැරලි, අරගල සහ විප්ලව, සන්නද්ධ හෝ බලහත්කාර පැහැරගැනීම්, බලහත්කාරයෙන් බලය ලබා ගැනීම්, ත්‍රස්තවාදී ක්‍රියා, කඩාකප්පල් කිරීම් හෝ හුදකලා කිරීම්, ව්‍යවහාර මුදල් සහ වෙළඳ සම්බාධක, තහනම් කිරීම්, සම්බාධක, යම් නීතියක් හෝ රජයේ නියෝගයක් සමග නිත්‍යානුකූලව හෝ නීතිවිරෝධී ලෙස අනුකූලව ක්‍රියාකිරීමේ අවස්ථාවක දී සිදුවන බලඅධිකාරී ක්‍රියාවක්, හිමිකම් පවරාගැනීම්, වැඩ තහනමට ගැනීම්, අත්කරගැනීම්, ජාතිකකරණය කිරීම, පීඩාවන්, වසංගත රෝග, ස්වාභාවික ආපදා හෝ අතිශය ස්වභාවික සිදුවීම්, පිපිරීම්, ගින්න, උපකරණ විනාශවීම්, වර්ජනය කිරීමක්, වැඩවර්ජනක් සහ වැඩවැරීමක්, මන්දගාමී ලෙස වැඩකිරීමක් වැනි පොදු කම්කරු කඩාකප්පල් ක්‍රියා, කර්මාන්තශාලා සහ පරිශ්‍ර අත්කර ගැනීම් අදහස් වේ.

(ග) **"වට්ටම (Hairent)"** යන්නෙන් යෝග්‍ය සුරකුම්පත් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, සුරකුම්පතක වෙළඳ අගය මත අදාළ වන වට්ටමක් අදහස් වේ.

(ච) **"ආදායම"** යන්නෙන් මිලදීගනු ලැබූ සුරකුම්පත් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, සලාක මුදල, පොළිය, ලාභාංශ සහ ඒ මත රක්ෂණකරු විසින් කරනු ලබන (මුල් මුදල සම්බන්ධයෙන් වන ගෙවීමක් හැර) වෙනත් යම් ගෙවීමක් අදහස් වේ.

(ට) **"ලංකා සෙක්‍යු"** යන්නෙන් අතිරේක කොටස් මුදල් රහිත සුරකුම්පත් ඉලෙක්ට්‍රොනික ලෙස නිකුත්කිරීම සඳහා, එම අතිරේක කොටස් මුදල් රහිත

සුරකුම්පත් ගබඩාකර දැරීම සඳහා සහ එම සුරකුම්පත්වල අයිතිය සහ සම්බන්ධතා වාර්තාකිරීම පිණිස මෙන්ම ලංකා සෙට්ල්හි අංගෝපාංගයක් සංයුක්ත වන අතිරේක කොටස් මුදල් රහිත සුරකුම්පත්වල ගනුදෙනු නිරාකරණය කිරීම පිණිස (සංශෝධිත) 1949 අංක 58 දරන මුදල් පනත ප්‍රකාරව පිහිටුවන ලද අතිරේක කොටස් මුදල් රහිත සුරකුම්පත් තැන්පතුගාර පද්ධතිය අදහස් වේ.

(ඩ) **"ලංකා සෙට්ල්"** යන්නෙන් (සංශෝධිත) 1949 අංක 58 දරන මුදල් පනතේ 62අ සහ 112අ වගන්තිවල කාර්ය සඳහා පිහිටුවන ලද ශ්‍රී ලංකා සැබෑ කාලීන දළ ගෙවා නිරාකරණය කිරීම් සහ අතිරේක කොටස් මුදල් රහිත සුරකුම්පත් තැන්පතුගාර පද්ධතිය අදහස් වේ;

(ණ) **"ශ්‍රී.ල.රු."** යන්නෙන් ශ්‍රී ලංකා රුපියල් අදහස් වේ;

(ත) **"වෙළඳ අගය"** යන්නෙන් ඕනෑම සුරකුම්පත් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, 2019 අංක 1 දරන විධානය ප්‍රකාරව නිශ්චය කරනු ලබන වෙළඳ අගය හෝ එකී විධානය බලාත්මකව නොපවතින අවස්ථාවක දී, අදාළ කාලයේ බලපවත්නා ශ්‍රී ලංකා මහබැංකුවේ වෙනත් යම් අදාල නීතියක්/නියෝගයක් ප්‍රකාරව හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරනු ලබන යෙදවුම් මූලාශ්‍රයක් මත හෝ **අලෙවිකරුගේ** ලේඛනගත අභ්‍යන්තර ප්‍රතිපත්තියක විධිවිධාන සලස්වා ඇති සහ **අලෙවිකරු** විසින් නිරන්තරයෙන් අදාළ කරගනු ලබන විධිවිධාන ප්‍රකාරව නිශ්චය කරනු ලබන වෙළඳ අගය අදහස් වේ.

(ද) **"පැහැරහැරීම පිළිබඳ නිවේදනය"** යන්නෙන් අදාල කඩිනම් ගෙවීම් දිනය සහ අවසන් කිරීමේ ගෙවීම් දිනය ද නිශ්චිතව දක්වනු ලබන නිවේදනයක් වන පැහැර හැරීමේ සිදුවීමක් සිදුවීමේදී පැහැර නොහැරීමේ පාර්ශවය විසින් පැහැර හැරීමේ පාර්ශවය වෙත ලබාදෙන නිවේදනයක් අදහස් වේ.

(න) **'අවසන්කිරීමේ අවස්ථාවක් පිළිබඳ නිවේදනය"** යන්නෙන් අදාල කඩිනම් දිනය සහ ගෙවීම් අවසන් කිරීමේ දිනය ද නිශ්චිතව දක්වනු ලබන

නිවේදනයක් වන අවසන් කිරීමේ සිදුවීමක් සිදුවන අවස්ථාවක දී පැහැර නොහැරීමේ පාර්ශවය විසින් අනෙක් පාර්ශවය වෙත ලබාදෙන නිවේදනයක් අදහස් වේ;

(ප) **"මිලදී ගැනීම් දිනය"** යන්නෙන් අදාල තහවුරුකිරීමේ නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති දිනය අදහස් වේ;

(බ) **"ගැනුම් මිල"** යන්නෙන් අදාල තහවුරුකිරීමේ නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති මිල අදහස් වේ;

(ම) **"මිලදීගනු ලබන සුරකුම්පත්"** යන්නෙන් අදාල තහවුරුකිරීමේ නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති සුරකුම්පත් අදහස් වන අතර ඒ සඳහා මෙහි 6 වන වගන්තිය ප්‍රකාරව ආදේශ කරන ලද යෝග්‍ය සුරකුම්පත් ද ඇතුළත් වන බවට සැලකිය යුතු වේ;

(ය) **"සැබෑ කාලීන දළ ගෙවා නිරාකරණය කිරීම (RTGS)"** යන්නෙන් ලංකා සෙටිල්හි අංගයක් සංයුක්ත වන සැබෑ කාලීනව දළ පදනමක් මත ඉලෙක්ට්‍රොනික ලෙස ගෙවීම් සැලසුම්කිරීම සහ ගෙවා නිරාකරණය කිරීම සම්බන්ධයෙන් වන පහසුකම අදහස් වේ;

(ර) **"ප්‍රතිමිලදී ගැනීම් දිනය"** යන්නෙන් අදාල තහවුරුකිරීමේ නිශ්චිතව දක්වා ඇති දිනය අදහස් වේ;

(අඅ) **"ප්‍රතිමිලදී ගැනීම් මිල"** යන්නෙන් අදාල තහවුරුකිරීමේ නිශ්චිතව දක්වා ඇති මිල අදහස් වේ;

(අආ) **"ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු"** යන්නෙන් අදාල තහවුරුකිරීමේ නිශ්චිතව දක්වා ඇති පරිදි මෙහි සඳහන් නියමයන්ට යටත්ව, එකඟ වූ දිනයක දී ("මිලදීගැනීමේ දිනය") එකඟ වූ මිලකට ("මිලදී ගැනීම් මිල") **අලෙවිකරු** විසින් ගනුදෙනුකරු වෙත යෝග්‍ය සුරකුම්පත් (මිලදී ගනු ලබන සුරකුම්පත්) විකිණීම සඳහා එකඟවන්නා වූද එයට සමගාමීව අදාල තහවුරුකිරීමේ

නිවේදනයේ නිශ්චතව දක්වා ඇති පරිදි මෙහි සඳහන් නියමයන්ට යටත්ව එකඟ වූ දිනක දී, ("ප්‍රතිමිලදී ගැනීම් දිනය") එකඟ වූ මිලකට ("ප්‍රතිමිලදී ගැනීමේ මිල") **අලෙවිකරු** වෙත ප්‍රතිමිලදී ගැනීම් සුරකුම්පත් විකිණීම සඳහා **ගනුදෙනුකරු** එකඟවන්නා වූ ගනුදෙනුවක් අදහස් වේ.

(අඇ) අදාල තහවුරුකිරීමේ නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට මෙහි සඳහන් නියමයන්ට යටත්ව **"පුනනවර්තන ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුව"** යන්නෙන් අදාල මිලදීගැනීම් දිනයේ දී අදාල මිලදීගැනීම් මිලට **ගනුදෙනුකරු** විසින් **අලෙවිකරු** වෙත මිලදීගනු ලැබූ සුරකුම්පත් විකිණීමට එකඟවන්නාවූ ද එයට සමාන්තරව අදාල ප්‍රතිමිලදී ගැනීම් දිනයේ දී අදාල ප්‍රතිමිලදීගැනීම් මිලට **අලෙවිකරු** විසින් **ගනුදෙනුකරු** වෙත මිලදීගනු ලැබූ සුරකුම්පත් විකිණීමට එකඟවන්නා වූ ද ගනුදෙනුවක් අදහස් වේ.

(අඈ) **"කොටස් රහිත සුරකුම්පත්"** යන්නෙන් සංශෝධිත 1949 අංක 58 දරන මුදල් පනත ප්‍රකාරව කොටස් රහිත ස්වරූපයෙන් ශ්‍රී ලංකා මහබැංකුව විසින් නිකුත් කරනු ලබන කොටස් රහිත භාණ්ඩාගාර බැඳුම්කර, කොටස් රහිත භාණ්ඩාගාර බිල්පත් සහ සුරකුම්පත් අදහස් වේ.

(අඉ) **"කොටස් රහිත භාණ්ඩාගාර බිල්පත්"** යන්නෙන් සංශෝධිත 1923 අංක 8 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත ප්‍රකාරව නිකුත් කරනු ලබන කොටස් රහිත භාණ්ඩාගාර බිල්පත් අදහස් වන අතර එයට එම ආඥාපනත ප්‍රකාරව කොටස් රහිත භාණ්ඩාගාර බිල්පත් බවට පරිවර්තනය කර ඇති භාණ්ඩාගාර බිල්පත් ඇතුලත් වේ.

(අඊ) **"කොටස් රහිත භාණ්ඩාගාර බැඳුම්කර"** යන්නෙන් 1923 අංක 8 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත ප්‍රකාරව නිකුත් කරනු ලබන කොටස් රහිත භාණ්ඩාගාර බැඳුම්කර අදහස් වන අතර එයට එම ආඥාපනත ප්‍රකාරව කොටස් රහිත භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කර ඇති භාණ්ඩාගාර බැඳුම්කර ඇතුලත් වේ.

(අඋ) **"අවසන්කිරීමේ නිවේදනය"** යන්නෙන් මෙහි 7(iii) වගන්තියට අනුව නිකුත් කරනු ලබන නිවේදනයක් අදහස් වේ.

(අඌ) **"අවසන්කිරීමේ ගෙවීම් දිනය"** යන්නෙන් අවසන් කිරීමේ නිවේදනයේ නිශ්චිතව දක්වා ඇති (මෙහි සඳහන් නියමයන්ට යටත්ව) මෙහි 7 වන වගන්තිය යටතේ අදාල මුදල ගෙවිය යුතු වන දිනය අදහස් වේ.

(අඑ) **"ගනුදෙනුව"** යන්නෙන් යන්නෙන් ප්‍රතිමිලදීගැනීම් ගනුදෙනුවක් හෝ ප්‍රත්‍යාවර්තන ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවක් අදහස් වේ.

එයට අමතරව, මෙම ගිවිසුමේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස;

(අ) වගන්තිවල ශීර්ෂයන් සඳහන් කිරීමේ පහසුව සඳහා පමණක් ඇතුළත් කර ඇති අතර එම ශීර්ෂ මගින් මෙම ගිවිසුමේ ව්‍යුවහයට බලපෑමක් ඇති නොවිය යුතු ය;

(ආ) වගන්ති සඳහා කරනු ලබන සඳහන් කිරීම් මෙම ගිවිසුමේ වගන්ති සඳහා කරනු ලබනු සඳහන් කිරීම් ලෙස තේරුම්ගනු ලැබිය යුතු ය.

(ඇ) ඒකවචන යෙදුම් සඳහා බහුවචන ද බහුවචන යෙදුම් සඳහා ඒකවචන ද ඇතුළත් වන අතර පුරුෂ ලිංග අර්ථයන් සහිත වචන සඳහා ස්ත්‍රී ලිංග අර්ථයන් සහ අලිංගික අර්ථයන් ද එහි පරස්පරය ද ඇතුළත් වේ; සහ

(ඈ) යම් නීතියක් හෝ උපකාරක නීතියක් සඳහා කරනු ලබන සඳහන් කිරීමක් මගින් කලින් කල සංශෝධිත, නැවත පනවන ලද හෝ ආදේශ කරන ලද එම නීතිය හෝ උපකාරක නීතිය සඳහා කරන ලද සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

2. ප්‍රතිමිලදීගැනීම් සහ පුනඃාවර්තන ප්‍රතිමිලදීගැනීම් ගනුදෙනු

(i) පාර්ශ්වකරුවන් විසින් ගනුදෙනුවකට ඇතුළත් වන අවස්ථාවක දී, ගනුදෙනුකරු විසින් 1 වන ඇමුණුමේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට සාරානුකූලව එක් එක් ගනුදෙනුව සඳහා වන නියම නිශ්චිතව දක්වමින් ගනුදෙනුකරු විසින් තහවුරු කිරීමේ ලිපියක් නිකුත්කරනු ලැබිය යුතු ය.

(ii) එම එක් එක් ගනුදෙනුව සඳහා වන සියලු තහවුරුකිරීම් සහ මෙම ප්‍රධාන ප්‍රතිමිලදීගැනීම් ගිවිසුම එක්ව එක් ගිවිසුමක් සංයුක්ත කරනු ලබන පරිදි, පාර්ශ්වකරුවන් අතර ඇතුළත් වන ගනුදෙනු (අන්‍යාකාරයකින් ප්‍රකාශිතව එකඟවී ඇත්නම් මිස) මෙම ප්‍රධාන ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුමට යටත් විය යුතු, එහි කොටසක් සංයුක්ත විය යුතු මෙන්ම එම ගනුදෙනු මෙම ප්‍රධාන ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම මගින් පාලනය විය යුතු ය.

(iii) 7 වන වගන්තියට යටත්ව;

(අ) එක් එක් ප්‍රතිමිලදීගැනීම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී-

(අ) මිලදී ගැනීම් දිනයේ දී - **අලෙවිකරු** විසින්, ගැනුම්මිල ලැබීමට යටත්ව, (**අලෙවිකරු** සමග ගිණුමක් පවත්වනු ලබන ගනුදෙනුකරුවකු සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, ගනුදෙනුකරු විසින් අලෙවිකරු සමග පවත්වනු ලබන ගනුදෙනුකරුගේ මුදල් ගිණුමෙන් **අලෙවිකරු** විසින් මුදල් හරකිරීම සිදුකළ හැකි පරිදි) **ගනුදෙනුකරුගේ** CDS ගිණුමට අදාළ මිලදීගැනීම් සුරකුම්පත් බැරකිරීම හෝ ගනුදෙනුකරුගේ CDS ගිණුම වෙත අදාළ මිලදීගැනීම් සුරකුම්පත් පැවරීම කරනු ලැබිය හැකි ය.

(ආ) ප්‍රතිමිලදීගැනීම් දිනයේ දී, **අලෙවිකරු** විසින් **ගනුදෙනුකරුගේ** CDS ගිණුමෙන් අදාළ මිලදීගැනීමේ සුරකුම්පත් හරකිරීම හෝ

ගනුදෙනුකරුගේ CDS ගිණුමෙන් අදාළ මිලදීගැනීමේ සුරකුම්පත් පැවරීමක් ලබාගෙන **අලෙවිකරු** සමග පවත්වන **ගනුදෙනුකරුගේ** මුදල් ගිණුම වෙත හෝ මෙම කාර්යය සඳහා **ගනුදෙනුකරු** විසින් නිශ්චිතව දක්වනු ලබන වෙනත් යම් ගිණුමක් වෙත ප්‍රතිමිලදීගැනීම් මිල බැරකිරීම හෝ **ගනුදෙනුකරු** සමග එකඟ විය හැකි වෙනත් යම් ආකාරයකින් ගෙවීම් සිදුකිරීම කරනු ලැබිය හැකි ය.

(ඇ) එක් එක් ප්‍රතිමිලදීගැනීම් ගනුදෙනුවක්ම සඳහා මිලදීගැනීම් මිලට මිලදීගැනීම් දිනයේ දී **අලෙවිකරු** විසින් **ගනුදෙනුකරු** වෙත මිලදීගැනීමේ සුරකුම්පත් විකිණීමෙන් සහ ප්‍රතිමිලදීගැනීම් මිලට ප්‍රතිමිලදීගැනීමේ දිනයේ දී **ගනුදෙනුකරුගෙන් අලෙවිකරු** විසින් මිලදීගැනීම් සුරකුම්පත් මිලදීගැනීමක් අන්තර්ගත වන බවටත්, (සැකදුරුකිරීමේ කාර්යය සඳහා) එම මිලදීගත් සුරකුම්පත්වල සමස්ථ නෛතික සහ අර්ථලාභී සම්බන්ධතාවය පිළිවෙලින් මිලදීගැනීමේ දිනයේ දී **ගනුදෙනුකරු** වෙත ද ප්‍රතිමිලදී ගැනීමේ දිනයේ දී **අලෙවිකරු** වෙත ද සතු කරනු ලැබිය යුතු බවටත් ප්‍රකාශිතව එකඟව පිළිගෙන සිටිනු ලැබේ.

(ආ) එක් එක් ප්‍රත්‍යාවර්තන ප්‍රතිමිලදීගැනීම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී:-

(අ) මිලදීගැනීම් දිනයේ දී, **අලෙවිකරු** විසින් ගනුදෙනුකරුගේ CDS ගිණුමෙන් අදාළ මිලදීගැනීම් සුරකුම්පත් හරකිරීම හෝ **ගනුදෙනුකරුගේ** CDS ගිණුමෙන් අදාළ මිලදීගැනීම් සුරකුම්පත් පැවරීමක් ලබාගෙන අලෙවිකරු සමග පවත්වන ගනුදෙනුකරුගේ මුදල් ගිණුම වෙත හෝ මෙම කාර්ය සඳහා **ගනුදෙනුකරු** විසින් නිශ්චිතව දක්වනු ලබන වෙනත් යම් ගිණුමක් වෙත මිලදී ගැනීම් මිල බැරකිරීම හෝ **ගනුදෙනුකරු**

සමග එකඟවිය හැකි වෙනත් යම් ආකාරයකින් ගෙවීම් සිදුකිරීම කරනු ලැබිය හැකි ය.

(ආ) මිලදීගැනීමේ දිනයේ දී, **අලෙවිකරු** විසින් ගනුදෙනුකරුගෙන් ප්‍රතිමිලදීගැනීම් මිල ලැබීමට යටත්ව, (අලෙවිකරු සමග ගිණුමක් පවත්වනු ලබන ගනුදෙනුකරුවකු සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, අලෙවිකරු විසින් තමා සමග පවත්වනු ලබන ගනුදෙනුකරුගේ මුදල් ගිණුමෙන් අලෙවිකරු විසින් මුදල් හරකිරීම සිදු කල හැකි පරිදි) ගනුදෙනකුරුගේ CDS ගිණුමට අදාළ මිලදීගැනීමේ සුරකුම්පත් බැරකිරීම හෝ ගනුදෙනුකරුගේ CDS ගිණුම වෙත අදාළ මිලදීගැනීම් සුරකුම්පත් පැවරීම කරනු ලැබිය හැකි ය.

(ඇ) එක් එක් ප්‍රත්‍යාවර්තන ප්‍රතිමිලදීගැනීම් ගනුදෙනුවක්ම සඳහා මිලදීගැනීම් මිලට මිලදීගැනීම් දිනයේ දී **ගනුදෙනුකරු** විසින් **අලෙවිකරු** වෙත මිලදීගැනීමේ සුරකුම්පත් විකිණීමෙන් සහ ප්‍රතිමිලදීගැනීම් මිලට ප්‍රතිමිලදීගැනීමේ දිනයේදී **අලෙවිකරුගෙන් ගනුදෙනුකරු** විසින් මිලදීගැනීම් සුරකුම්පත් මිලදීගැනීමක් අන්තර්ගත වන බවටත්, (සැකදුරුකිරීමේ කාර්යය සඳහා) එම මිලදීගත් සුරකුම්පත්වල සමස්ථ නෛතික සහ අර්ථලාභී සම්බන්ධතාවය පිළිවෙලින් මිලදීගැනීමේ දිනයේ දී **අලෙවිකරු** වෙත ද, ප්‍රතිමිලදී ගැනීමේ දිනයේ දී **ගනුදෙනුකරු** වෙත ද සතු කරනු ලැබිය යුතු බවටත් ප්‍රකාශිතව එකඟව පිළිගෙන සිටිනු ලැබේ.

(iv) වෙළඳපල වටිනාකම පවත්වාගෙන යෑමේ අරමුණින් යුතුව ප්‍රතිපාර්ශව දෙකක් අතර මිලදීගැනීමේ සුරකුම්පත් සඳහා නව සැපයුමක් ලබාගැනීම සහ/හෝ ඉවත්කිරීම සඳහා මිලදීගැනීම් දින සිට ප්‍රතිමිලදීගැනීම් දිනය දක්වා අවසර දෙනු ලැබිය යුතු යී

3. **ආදායම**

(i) මිලදීගැනීමේ දිනයෙන් පසුව ඕනෑම අවස්ථාවක දී සහ/හෝ ප්‍රතිමිලදීගැනීම් දිනයේදී හෝ එම දිනයට පෙරාතුව ප්‍රතිමිලදීගැනීම් ගනුදෙනුවක විෂය වස්තුව වන්නා වූ මිලදීගැනීමේ සුරකුම්පත් සම්බන්ධයෙන් නිකුත්කරන්නා විසින් යම් ආදායම් ගෙවීමක් ("ආදායම් ගෙවීම") සිදුකර ඇති අඅවස්ථාවක දී, එම මුදල (සැකදුරුකිරීමේ කාර්ය සඳහා) එම මුදලට පරම වශයෙන් හිමිකම් ලබන **අලෙවිකරුගේ** ගිණුම වෙත ලැබීය යුතු අතර එම ආදායම් මුදල **ගනුදෙනුකරු** වෙත ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී, එම මුදල ලැබීමේ ව්‍යාපාරික දිනයේ දීම **ගනුදෙනුකරු** විසින් එසේ තමා වෙත ලැබී ඇති මුදලට සමාන මුදලක් **අලෙවිකරු** වෙත ගෙවනු ලැබිය යුතු ය; සහ

(ii) මිලදී ගැනීමේ දිනයෙන් පසුව ඕනෑම අවස්ථාවක දී සහ/හෝ ප්‍රතිමිලදීගැනීම් දිනයේ දී හෝ එම දිනයට පෙරාතුව ප්‍රත්‍යාවර්තන ප්‍රතිමිලදීගැනීම් ගනුදෙනුවක් යටතේ මිලදී ගැනීමේ සුරකුම්පත් සම්බන්ධයෙන් නිකුත් කරන්නා විසින් යම් ආදායම් ගෙවීමක් **("ආදායම් ගෙවීම")** සිදුකර ඇති අවස්ථාවක දී, එම මුදල **ගනුදෙනුකරුගේ** ගිණුම වෙත ලැබිය යුතු අතර, එම මුදල **අලෙවිකරු** වෙත ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී, එම මුදල ලැබීමේ ව්‍යාපාරික දිනයේදීම **අලෙවිකරු** විසින් එසේ තමා වෙත ලැබී ඇති මුදලට සමාන මුදලක් **අලෙවිකරු** වෙත ගෙවනු ලැබිය යුතු ය.

4. **නියෝජන**

(i) ගනුදෙනුකරු විසින් වෙළෙන්දා වෙත පහත පරිදි කරුණු කියා සිටියි. (එම කරුණු කියා සිටීම **ගනුදෙනුකරු** විසින් ගනුදෙනුවකට ඇතුළත් වන එක් එක් දිනයේ දී **ගනුදෙනුකරු** විසින් නැවත ප්‍රකාශ කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.):-

(අ) ගිවිසුම යටතේ සහ මෙම ගිවිසුමේ සඳහන් නියමයන් මත මේ යටතේ වූ ගනුදෙනු සහ අදාළ තහවුරු කිරීම් යටතේ වූ ස්වකීය වගකීම්වලට ඇතුළත් වීම සඳහා සහ ඒවා ඉටුකිරීම සඳහා

ගනුදෙනුකරුට සම්පූර්ණ බලය, හැකියාව සහ අධිකාරී බලය පවතින අතර ගනුදෙනුකරු විසින් එම වගකීම්වලට ඇතුළත් වීම සහ ඒවා ඉටුකිරීම සඳහා අවශ්‍ය යම් සහ සියලු අධිකාරී බලය සහ අනුමතයන් ලබාගෙන ඇත;

(ආ) ගනුදෙනුකරු විසින් මෙම ගිවිසුම ඇතුළත් වන අතර ඒ යටතේ වූ එම ගනුදෙනු ප්‍රධාන ගනුදෙනු වශයෙන් පවතියි;

(ඇ) යම් ගනුදෙනුවක් යටතේ හෝ මේ යටතේ ගනුදෙනුකරු විසින් ගෙවනු ලබන සියලු මුදල්වල පරම අර්ථලාභී අයිතිකරු **ගනුදෙනුකරු** වේ; හවුල් ගනුදෙනු සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, යම් හවුල් පාර්ශ්වකරුවකුගේ මරණය සිදුවීමේ දී, එම හවුල් ගනුදෙනුවේ දී, මියගිය තැනැත්තාගේ සියලු අයිතිවාසිකම් ජීවත්ව සිටින හවුල් පාර්ශ්වකරු/පාර්ශ්වකරුවන්ට හිමි විය යුතු ය.

(ඈ) (**ගනුදෙනුකරුගේම** තීරණය කිරීම සහ ඇගයීම මත පදනම්ව හෝ **අලෙවිකරුගෙන්** ස්වාධීනව **ගනුදෙනුකරු** විසින් ලබාගැනීමට අවශ්‍ය බව සලකන යම් වෘත්තීය උපදෙස් මත පදනම්ව) බදු සහ ගිණුම්කරන පරාමිතීන් මෙන්ම ගනුදෙනුවලට ඇතුළත්වීමේ දී **ගනුදෙනුකරුගේ** මූල්‍යමය අවස්ථානුගත කරුණු අනුව පවතින විභව්‍ය මූල්‍ය ප්‍රතිලාභ සහ අවදානම් මෙන්ම යෝග්‍යභාවය පිළිබඳව **ගනුදෙනුකරු** සම්පූර්ණයෙන් ම දැනුවත් කරනු ලැබිය යුතු මෙන්ම එම කරුණු ඇගයීම සඳහා ගනුදෙනුකරුට ප්‍රමාණවත් දැනීමක් සහ පළපුරුද්දක් තිබිය යුතු ය;

(ඉ) ගනුදෙනු සම්බන්ධයෙන් සහ මෙම ගිවිසුම සම්බන්ධයෙන් **ගනුදෙනු** විසින් **අලෙවිකරුගේ** අදහස් හෝ උපදෙස් මත රඳා නොපවතින අතර **ගනුදෙනුකරුගේම** ඇගයීම මත පදනම්ව (**ගනුදෙනුකරු** විසින් අවශ්‍ය බවට සලකන **ගනුදෙනුකරුගේ** වෘත්තීයමය උපදේශකවරුන්ගෙන් ලබාගන්නා යම් උපදෙස්

ඇතුලුව) **ගනුදෙනුකරු** විසින් එම ගනුදෙනුවලට ඇතුළත්වීමට තීරණය කරනු ඇත; සහ

(ඊ) මේ යටතේ වූ යම් ගනුදෙනුවක පාර්ශවයක් බවට පත්වෙමින් බදු අනුමිති තක්සේරු කිරීම සම්බන්ධයෙන් ගනුදෙනුකරු පරම වශයෙන් සෑහීමට පත්විය යුතු මෙන්ම අඛණ්ඩව වගකියනු ලැබිය යුතු ය.

(ii) **අලෙවිකරු** විසින් **ගනුදෙනුකරු** වෙත පහත පරිදි කියා සිටියි; **(අලෙවිකරු** විසින් ගනුදෙනුවකට ඇතුළත් වන එක් එක් දිනයේ දී **අලෙවිකරු** විසින් නැවත සිදුකරනු ලැබිය යුතු ලෙස සලකනු ලබන කරුණු දැන්වීම්);

(අ) මෙම ගිවිසුමේ සඳහන් නියමයන්ට සහ අදාළ තහවුරුකිරීම්වලට යටත්ව ගිවිසුම යටතේ සහ ඒ යටතේ වූ ගනුදෙනු යටතේ ස්වකීය වතකීම්වලට ඇතුළත්වීම සඳහා සහ එම වගකීම් ඉටුකිරීම සඳහා **ගනුදෙනුකරුට** සම්පූර්ණ බලය, හැකියාව සහ අධිකාරිය පවතින මෙන්ම ගනුදෙනුකරු විසින් ඒ සඳහා අවශ්‍ය අධිකාරී බලය සහ කැමැත්ත ලබාගෙන ඇත.

(ආ) අලෙවිකරු විසින් ඇතුළත් වන ගනුදෙනු මගින් අලෙවිකරුගේ තත්කාලයේ බල පවත්නා ගනුදෙනුවල යම් විචක්ෂණ ආචාරධර්ම හෝ නියෝග උල්ලංඝනයවීමක් සිදු නොවිය යුතු ය.

5. බදු

අන්‍යාකාරයකින් එකඟ වී ඇත්නම් මිස සහ නීතිය මගින් හෝ බදු අධිකාරියක පරිචය මගින් බදු රැඳවීමක් හෝ අඩුකිරීමක් නියම කර ඇත්නම් මිස, බදු අයකිරීම සඳහා බලය ඇති යම් අධිකාරියක් විසින් පනවනු ලබන, අයකරන, රැස්කරන, රඳවාගනු ලබන හෝ තක්සේරු කරනු ලබන ඕනෑම ස්වභාවයක බදු හෝ අයකිරීම්වලින් නිදහස්ව සහ තොරව මෙන්ම එවැනි බදු හා අයකිරීම් රඳවා ගැනීමෙන් හෝ අඩුකිරීමෙන් තොරව මේ යටතේ වූ යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් වන සියලු ගෙවීම් ලබාදිය යුතු වේ. එවැනි අවස්ථානුගත කරුණුවලදී, බදු අඩුකර එවැනි ගෙවීම් සිදුකිරීම සඳහා ගෙවීම් සිදුකරන පාර්ශවය බැඳී නොසිටිය යුතු අතර එම රැඳවීම් හෝ අඩුකිරීම් සිදුකිරීමෙන් පසුව උපචිත වන ශුද්ධ මුදල ලබාගැනීමේ පාර්ශවය වෙත ගෙවනු ලැබිය යුතු ය.

6. ආදේශ කිරීම

(i) මිලදීගැනීම් දිනය සහ ප්‍රතිමිලදීගැනීම් දිනය අතර ඕනෑම අවස්ථාවක දී සිදුවන ප්‍රතිමිලදීගැනීම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, මිලදීගැනීමේ සුරකුම්පත් වෙනුවට **අලෙවිකරු** විසින් වෙනත් යෝග්‍ය සුරකුම්පත් ආදේශ කරනු ලැබිය හැකි නමුත් ආදේශ කිරීමේ දිනය වන විට ආරම්භක වශයෙන් ආදේශ කරන ලද මිලදීගැනීමේ සුරකුම්පත්වල වෙළඳපල වටිනාකමට යටත් පිරිසයෙන් සමාන වන වෙළඳපල වටිනාකමක් එම ආදේශ කරන ලද යෝග්‍ය සුරකුම්පත් සඳහා තිබිය යුත්තේ ය;

එම වෙනත් යෝග්‍ය සුරකුම්පත් **ගනුදෙනුකරු** වෙත පැවරීම මගින් සහ එම ආදේශ කරන ලද මිලදී ගැනීමේ සුරකුම්පත් සම්බන්ධයෙන් සමාන සුරකම්පත්වල අදාළ වටිනාකම **අලෙවිකරු** වෙත එම අවස්ථාවේදීම පැවරීම් මගින් එම ආදේශ කිරීම සිදු කළ යුතු වේ.

ආදේශ කිරීමෙන් පසුව, ආදේශ කරන ලද සුරකුම්පත්, මිලදී ගත් සුරකුම්පත් ලෙස සලකනු ලැබිය යුතු අතර එසේ ආදේශ කරන ලද මුල් මිලදී ගැනීමේ සුරකුම්පත්, මිලදී ගත් සුරකුම්පත් වීම අවසන් විය යුතු ය. ඒ අනුව **ගනුදෙනුකරුගේ** CDS ගිණුම හර කිරීම සහ බැර කිරීම සඳහා හෝ ඒ අනුව **ගනුදෙනුකරුගේ** CDS ගිණුමෙන් පැවරීමක් ලබාගැනීම සඳහා හෝ එම ගිණුමට පැවරීමක් සිදුකිරීම සඳහා **අලෙවිකරුට** හිමිකමක් තිබිය යුතු ය.

(ii) එම ආදේශ කිරීම් **අලෙවිකරුගේ** විවෘත පදනම හෝ ප්‍රතිමිලදී ගැනීමේ පදනම් මත වන විකිණීම් සිදුකිරීම සඳහා පහසුකම් සැලැස්වීමට එම ආදේශකිරීම් සඳහා නියම වනු ලැබිය හැකි ය.

7. පැහැර හැරීමේ අවස්ථාව/ අවසන්කිරීමේ අවස්ථාව

(i) පහත දැක්වෙන අවස්ථාවන් මෙම ගිවිසුම යටතේ වන පැහැර හැරීමේ අවස්ථා සංයුක්ත කරනු ලබයි; එනම්

(අ) මේ යටතේ වූ ගෙවීම් හෝ භාරදීම් වගකීම් ඉටු කිරීමට පාර්ශවකරුවන්ට සිදුවන අපොහොසත් වීම්;

(ආ) මේ යටතේ යම් පාර්ශවයක් විසින් සිදුකරන යම් නියෝජනයක් යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් සාවද්‍ය හෝ නොමඟ යවන සුළු නියෝජනයක් වීම;

(ඇ) යම් පාර්ශවයක් සම්බන්ධයෙන් වන බුන්වත්භාවය පිළිබඳ ක්‍රියාවක්;

(ඈ) කාලය ඉකුත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් හැර, පාර්ශව අතර පවතින වෙනත් යම් ගිවිසුම්ගත සම්බන්ධතාවක් අවසන්වීම;

(ii) තනි පුද්ගලයකු වන **ගනුදෙනුකරු** මිය යන්නේ හෝ සිහිවිකල තැනැත්තකු බවට පත්වන්නේ නම් හෝ අන්‍යාකාරයකින් අශක්නුතාවයකට පත්වේ නම්, මිය යන අවස්ථාවක් සම්බන්ධයෙන් වන විට, **ගනුදෙනුකරු** විසින් **අලෙවිකරු** වෙත ලබාදීමට හිඟව පවතින මූල්‍යමය වගකීම් ගනුදෙනුකරු මියයෑමේ දින සිට දිනතිහක් (30) ඇතුළත සපුරා නොතිබිම;

(iii) පැහැර හැරීමේ පාර්ශවය විසින් දැනුවත්ව සිටින පැහැර හැරීමේ පාර්ශවය සම්බන්ධයෙන් වන පැහැරහැරීමේ ක්‍රියාවක් සිදුවීම පිළිබඳව පැහැර නොහැරීමේ පාර්ශවය වෙත නිවේදනය කිරීම සඳහා පැහැර හැරීමේ පාර්ශවය වගකියනු ලැබිය යුතුය.

(iv) පැහැර හැරීමේ සිදුවීමක් සිදුවන අවස්ථාවකදී, පැහැර-නොහැරීමේ පාර්ශවය විසින් පැහැරහැරීමේ පාර්ශවය වෙත ගිවිසුම අවසන් කිරීමේ නිවේදනයක් භාරදිය හැකිවේ.

(v) පැහැර-නොහැරීමේ පාර්ශවය විසින් ගිවිසුම අවසන් කිරීමේ නිවේදනයක් භාරදෙන අවස්ථාවකදී, මේ යටතේ වූ එක් එක් ගනුදෙනුව සම්බන්ධයෙන් වන ප්‍රතිමිලදී ගැනීම් දිනය, කඩිනම් දිනය දක්වා කඩිනම් කරනු ලැබිය යුතුය.

(එම දිනය මෙහි සඳහන් නියමයන් ප්‍රකාරව ගිවිසුම අවසන් කිරීමේ නිවේදනය ලැබී ඇති ලෙස සලකනු ලබන දිනයට වඩා කලින් එළඹෙන දිනයක් නොවිය යුතුය). එක් එක් ගනුදෙනුව සම්බන්ධයෙන් වන අදාළ ප්‍රතිමිලදී ගැනීමේ දිනය කඩිනම් කිරීම පිළිබඳව සලකා බැලීම සඳහා අලෙවිකරු විසින් සද්භාවයෙන් නිශ්චය කරනු ලබන මුදලකට ඒ අනුව එක් එක් ගනුදෙනුව සම්බන්ධයෙන් වන ප්‍රතිමිලදී ගැනීම් මිල සංශෝධනය කරනු ලැබිය යුතු ය. (එම සංශෝධිත ප්‍රතිමිලදී ගැනීම් මිල ''සංශෝධිත ප්‍රතිමිලදී ගැනීම් මිල'' ලෙස හඳුන්වනු ලැබේ.);

(vi) කඩිනම් කිරීමේ දිනයක් එසේ ක්‍රියාත්මක වන අවස්ථාවක දී, (A) වෙළෙන්දා විසින් (අ) මේ යටතේ මිලදී ගැනීමේ සුරකුම්පත්වල වෙළෙඳපොළ වටිනාකම සහ (ආ) මේ යටතේ වූ සංශෝධිත ප්‍රතිමිලදී ගැනීම් මිල ගණන් තීරණය කරනු ලැබිය යුතු අතර (ආ) ගනුදෙනු සම්බන්ධයෙන් වන පාර්ශවකරුවන්ගේ වගකීම පහත දැක්වෙන පරිදි ස්වයංක්‍රීයව ප්‍රතියෝජනය කරනු ලැබිය යුතු ය; එනම්

(A) (අ) සියලු ප්‍රතිමිලදීගැනීම් ගනුදෙනු යටතේ වූ වෙළඳපළ වටිනාකම්වල සමස්ථ එකතුව සහ (ආ) සියලු ප්‍රත්‍යාවර්තන මිලදීගැනීම් ගනුදෙනු යටතේ වූ සංශෝධිත ප්‍රතිමිලදී ගැනීම් මිල ගණන්වල සමස්ත එකතුව (''ගනුදෙනුකරුගේ මුදල් ප්‍රමාණයන්'') ගිවිසුම අවසන් කිරීමේ ගෙවීම් දිනයේදී **අලෙවිකරු** වෙත පවතින අතිරික්ත මුදලට සමාන මුදලක් ගෙවීම සඳහා වන (මෙහි 7(vii) වගන්තියට යටත්ව) **ගනුදෙනුකරුගේ** පාර්ශවයේ වගකීමක් වන (ඇ) සියලු ප්‍රත්‍යාවර්තන ගනුදෙනු යටතේ වූ වෙළඳපොළ වටිනාකම්වල සමස්ථ එකතුව සහ (ඈ) ප්‍රතිමිලදීගැනීම් ගනුදෙනුව යටතේ වු සංශෝධිත මිලදීගැනීම් මිල ගණන්වල සමස්ථ එකතුව (එම මුදල ''ගනුදෙනුකරුගේ මුදල් ප්‍රමාණයන්'' ලෙස හඳුන්වනු ලබන), ඉක්මවනු ලබන අවස්ථාවකදී; සහ

(ආ) [මෙහි 7(vi)(ආ)(1) වගන්තියේ අර්ථ නිරූපණය කර ඇති පරිදි] **ගනුදෙනුකරුගේ** මුදල් ප්‍රමාණය, (මෙහි 7(vii) වගන්තියට යටත්ව)

ගිවිසුම අවසන් කිරීමේ ගෙවීම් දිනයේ දී **ගනුදෙනුකරු** වෙත පවතින අතිරික්ත මුදලට සමාන මුදලක් ගෙවීම සඳහා වන **ගනුදෙනුකාර** පාර්ශවයේ වගකීමක් වන (මෙහි 7(vi)(ආ)(1) වගන්තියේ අර්ථ නිරූපණය කර ඇති) **ගනුදෙනුකරුගේ** මුදල් ප්‍රමාණය ඉක්මවන අවස්ථාවක දී;

(vii) ගිණුම් ඒකාබද්ධ කිරීමේ, ශුද්ධ අගයකට ගෙන ඒ මේ හෝ **අලෙවිකරු** සතුවන හිලව්කිරීමේ වෙනත් යම් අයිතිවාසිකම් සීමා කිරීමකින් තොරව, එවැනි වෙනත් මුදල් මෙම ගිවිසුම යටතේ හෝ අන්‍යාකාරයකින් උපචිත වුවද එය නොසලකා හරිමින්, එක් එක් අවස්ථාවේදී (අ) **අලෙවිකරු** වෙත මෙහි 7(vi)(ආ)(1) වගන්තිය යටතේ ගෙවිය යුතු යම් මුදලක් තමා වෙත **ගනුදෙනුකරුගෙන්** අයවිය යුතු යි වෙනත් යම් මුදලකට එරෙහිව සහ (ආ) 7(vi)(ආ)(2) වගන්තිය යටතේ අලෙවිකරු වෙත ගනුදෙනුකරුගෙන් අයවිය යුතු වෙනත් යම් මුදලකට එරෙහිව හිලව් කරනු ලැබිය හැකිය.

8. නිවේදන

ගනුදෙනුකරුගේ ඉහත සඳහන් ලිපිනය වෙත හෝ **ගනුදෙනුකරු** විසින් අලෙවිකරු වෙත නිවේදනය කරනු ලැබිය හැකි වෙනත් යම් ලිපිනයන් වෙත නිවේදන ලබාදිය හැකි අතර එම නිවේදන;

(i) අලෙවිකරුගේ ව්‍යාපාරික දිනයකදී (''ව්‍යාපාරික කාලය තුළදී'') ව්‍යාපාරික කාලය තුළදී පුද්ගලිකව භාරදී ඇත්නම් (නැතහොත් එම භාරදීමේ දිනය ව්‍යාපාරික දිනයක් නොවේනම් හෝ භාරදීමේ වේලාව ව්‍යාපාරික කාලයෙන් පරිභාහිර කාලයක් වේ නම්, ඉන් ඉක්බිතිවම එළඹෙන ව්‍යාපාරික දිනයේ ව්‍යාපාරික කාලය ආරම්භ වන අවස්ථාවේදී);

(ii) ෆැක්ස් මගින් භාරදී ඇති අවස්ථාවකදී, එම භාරදීම පිළිබඳ අදාළ නිවේදනය ලැබීමේ ව්‍යාපාරික දිනයේදී (හෝ එම ෆැක්ස් පණිවුඩය ව්‍යාපාරික දිනයක් නොවන දිනයකදී හෝ භාරදීමේ වේලාව ව්‍යාපාරික

කාලයෙන් පරිබාහිර කාලයක් වන අවස්ථාවකදී, ඉන්පසුව එළඹෙන ව්‍යාපාරික දිනයේ ව්‍යාපාරික කටයුතු සිදුකිරීම ආරම්භ කරන අවස්ථාවේදී) සහ,

(iii) තැපැල් මගින් භාරදී ඇති අවස්ථාවකදී, එම භාරදීමේ දිනයට පසුව එළඹෙන ව්‍යාපාරික දින දෙකක් තුළදී,

(iv) විද්‍යුත් තැපෑලෙන් යොමු කර ඇත්නම්, එම විද්‍යුත් පණිවුඩය යවන්නාගේ පද්ධතිය හරහා යවා ඇති බවට යවන්නාගේ පද්ධතියේ වාර්තාවන අවස්ථාවේදී;

එම නිවේදන **ගනුදෙනුකරු** වෙත ලැබී ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

9. ප්‍රමාද වී කරන ගෙවීම් මත පොලිය

යම් ගනුදෙනුවක් යටතේ හෝ ගිවිසුම යටතේ යම් ගෙවීමක් සිදුකිරීමට පාර්ශවකරු අපොහොසත් වන අවස්ථාවකදී, එම ගෙවීම ලැබිය යුතු දිනය ද ඇතුළුව එම දින සිට සහ අනෙක් පාර්ශවය වෙත අදාළ ගෙවීම ඇත්ත වශයෙන්ම ලැබෙන දිනය බැහැර කිරීමෙන් පසුව අදාළ කාල සීමාම සඳහා ගෙවිය යුතුවන එහෙත් ගෙවා නොමැති මුදල මත පැහැරහැරීමේ අනුපාතිකය යටතේ එම පාර්ශවය විසින් පොළිය ගෙවනු ලැබිය යුතු ය. දෛනික එකතුව මත සහ කල් ඉකුත්වූ සැබෑ දින ගණන මත පදනම්ව එම පොලිය ගණනය කරනු ලැබිය යුතුය.

10. පැවරිය නොහැකි බව

(i) යම් පාර්ශවයක් විසින් අනෙක් පාර්ශවයේ පූර්ව ලිඛිත කැමැත්ත ලබා ගැනීමෙන් තොරව, මෙම ගිවිසුම යටතේවූ ස්වකීය අයිතිවාසිකම් සහ වගකීම් පැවරීම හෝ පවරාදීම හෝ ඒ සම්බන්ධයෙන් තුන්වන පාර්ශවයක් නිර්මාණය කිරීමට අපේක්ෂා කිරීම සිදු නොකළ යුතුයි.

(ii) මිලදී ගැනීම් දිනය සහ ප්‍රතිමිලදීගැනීම් දිනය අතර කිසිදු අවස්ථාවකදී මිලදී ගන්නා ලද සුරකුම්පත් අලෙවි කරනු නොලැබිය යුතු ය. එසේ වුවද ගනුදෙනුවේ මිලදී ගැනීමේ සහ ප්‍රතිමිලදී ගැනීමේ දිනය ඇතුළත ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු සඳහා **අලෙවිකරු** විසින් මිලදී ගන්නා ලද සුරකුම්පත් භාවිත කරනු ලැබිය හැකි ය.

11. අලෙවිකරුගේ වගකීම්/ අදිසි තත්ත්වය නිසා ගිවිසුම බලාත්මක කළ නොහැකි වීම.

(i) මේ යටතේ වූ **අලෙවිකරුගේ** වගකීම් අලෙවිකරු විසින් පමණක් ඉටු කළ යුතු අතර එම ඉටු කිරීම සියලු අදාළ නීතිවලට, නියෝගවලට, විධානවලට, විනය නීති සංග්‍රහවලට, ලංකා සෙට්ල් පද්ධති රීතිවලට සහ ශ්‍රී ලංකාවේ වෙනත් මාර්ගෝපදේශවලට දැඩි ලෙස අනුකූලව සිදු විය යුතු ය. අදිසි තත්ත්වයක් නිසා ගිවිසුම බලාත්මක කළ නොහැකිවීම හේතුවෙන් හෝ රජයේ ක්‍රියාවක් හේතුවෙන් මේ යටතේ වූ ස්වකීය වගකීම් ඉටුකිරීමට **අලෙවිකරුට** නොහැකි වන හෝ ප්‍රායෝගික නොවන අවස්ථාවකදී, **අලෙවිකරුට** එම වගකීම් ඉටුකිරීමට නොහැකි වන හෝ ප්‍රායෝගික නොවන තාක්දුරට එම වගකීම් අත්හිටවනු නොවිය යුතු අතර එම අත්හිටුවීමේ කාලසීමාව තුළදීම අත්හිටුවන ලද වගකීම් සම්බන්ධයෙන් (එම අත්හිටුවීම සිදුනොවූ වගකීම් සම්බන්ධයෙන් ගෙවිය යුතුව පැවති පොළිය සහ වෙනත් ගෙවීම් හැර) කිසිදු පොළියක් හෝ වෙනත් ගෙවීමක් සිදුකරනු නොලැබිය යුතුවේ; එසේ වුවද, එම අවස්ථානුගත කරුණුවලදී ගනුදෙනු ශුද්ධ අගයකට ගෙන ඒම හෝ හිලව් කිරීමේදී අලෙවිකරුට එම වගකීමේ වටිනාකම ඇතුළත් කිරීමට හැකියාව ලබාදීම පිණිස අනෙක් පාර්ශවය සම්බන්ධයෙන් වන පැහැරහැරීමක් හෝ අවසන්කිරීමේ සිදුවීමකදී අදාළ වගකීම ඉටුකල යුතු බවට **අලෙවිකරු** විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

12. පාලනය වන නීතිය/ නිසි අධිකරණ බලය වෙත නඩු කටයුතු ඉදිරිපත් කිරීම

මෙම ගිවිසුම සහ ඒ යටතේ ඇතුළත් වී ඇති සියලු ගනුදෙනු ශ්‍රී ලංකාවේ නීතිය මඟින් පාලනය විය යුතු අතර මෙහි පාර්ශවකරුවන් විසින් ස්වකීය විසඳිය යුතු ප්‍රශ්න ශ්‍රී ලංකාවේ අධිකරණවල පරම අධිකරණ බලය සහිත අධිකරණ වෙත යොමු කළ යුතුයි.

මෙම ගිවිසුමට සාක්ෂි වශයෙන්, මෙහි සඳහන් පාර්ශවකරුවන් විසින් මෙම ලේඛනයේ පළමු පිටුවේ සඳහන් දින සිට බලාත්මක වන පරිදි පහත නිශ්චිතව පිළිවෙලින් සඳහන් කර ඇති දිනවලදී මෙම ගිවිසුම ලියා අත්සන් කරන ලදී.

අලෙවිකරුගේ නම:-

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක්,

.... විසින් ය.
බලයලත් අත්සන්කරු
නම : ....
තනතුර : ....
දිනය : ....

.... විසින් ය.
බලයලත් අත්සන්කරු
නම : ....
තනතුර : ....
දිනය : ....

සාක්ෂි :

අත්සන : ....
නම : ....

අත්සන : ....
නම : ....

(**ගනුදෙනුකරු** තනිපුද්ගලයකු වන අවස්ථාවක දී)

අත්සන : ....

අත්සන් කල ස්ථානය : ....
(පුරවරය/නගරය)

සාක්ෂි :

අත්සන : ....
නම : ....

අත්සන : ....
නම : ....

[ගනුදෙනුකරු සංස්ථාගත කර ඇති ආයතනයක් වන අවස්ථාවක දී]

.... ඉදිරිපිට දී .... (පුරවරය/නගරය) යන ස්ථානයේ දී .... යන ආයතනයේ පොදු මුද්‍රාව තබන ලදී.

(මුද්‍රා තැබීම සහ අධ්‍යක්ෂවරුන්ගේ අත්සන් කිරීම)

අත්සන :	අත්සන : ....
නම :	නම : ....
(අධ්‍යක්ෂ)	(අධ්‍යක්ෂ/සමාගම් ලේකම්)

මෙහි මුද්‍රාතැබීම මෙයින් සහතික කරනු ලැබේ;

සාක්ෂි :

අත්සන :	අත්සන : ....
නම :	නම : ....

නැතහොත්

අත්සන්කරනු ලැබුවේ:-

අත්සන :	අත්සන : ....
නම :	නම : ....

[සමාගමේ බලයලත් අත්සන්කරුවන් විසින් .... යන ස්ථානයේ දී (පුරවරය/නගරය) අත්සන් කරන ලදී.]

සාක්ෂි :

අත්සන :	අත්සන : ....
නම :	නම : ....

I වන ඇමුණුම

අලෙවිකරුගේ ලිපි ශීර්ෂය

වෙතටයි :- [ගනුදෙනුකරු]

වෙතින්ය :- [අලෙවිකරුගේ නම]

දිනය :- ....

විෂය :- ගනුදෙනුව (යොමු අංකය :- ....)

හිතවත් මහත්වරුන් වෙතටයි:

[(**"ගිවිසුම"** යනුවෙන් සඳහන් කරනු) ප්‍රධාන ප්‍රතිමිලදීගැනීම් ගිවිසුමේ කාර්ය සඳහා "තහවුරු කිරීමක්" සංයුක්ත වන] මෙම ලිපියේ අරමුණ වනුයේ පහත සඳහන් ගිවිසුම් දිනයේ දී ඇතුළත් වූ අප අතර පවතින ප්‍රතිමිලදීගැනීම් ගිවිසුමේ නියම හා කොන්දේසි නිශ්චිතව දැක්වීම වේ.

මෙම තහවුරුකිරීම මෙම ගිවිසුමේ අතිරේකයක් මෙන්ම එහි කොටසක් සංයුක්ත කරනු ලබන මෙන්ම මෙම ගිවිසුමට යටත් වන්නේ ය; පහත ප්‍රකාශිතව සංශෝධනය කර ඇති ආකාරයට හැර මෙම ගිවිසුමේ අන්තර්ගත සියලු විධිවිධාන මගින් මෙම තහවුරු කිරීම පාලනය කරනු ලබයි. ගිවිසුමේ අර්ථනිරූපනය කර ඇති සහ මෙම තහවුරු කිරීමේ දී භාවිතකර ඇති වචන සහ වාක්‍ය කාණ්ඩ සඳහා ගිවිසුමේ ඇති අර්ථයන්ම තිබිය යුත්තේ ය.

මෙම තහවුරු කිරීම මගින් හෙළිදරව් කරනු ලබන ගනුදෙනු ලංකා සෙක්‍යු ආයතනයේ මධ්‍යම තැන්පතුභාර පද්ධතියේ වාර්තාගත කරනු ලැබිය යුතු ය.

1. ගිවිසුම් දිනය:-
2. ගනුදෙනුවේ ස්වභාවය [ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුව] [ප්‍රත්‍යාවර්තන ප්‍රතිමිලදීගැනීම් ගනුදෙනුව]
3. මිලදී ගනු ලැබූ සුරකුම්පත් :- [විස්තර + SIN යනාදී අංක]

4. මිලදීගැනීමේ දිනය:-

5. ගැනුම් මිල:- [........................] ශ්‍රී. ල. රු. ....

6. ප්‍රතිමිලදී ගැනීම් දිනය :-

7. ප්‍රතිමිලදී ගැනීම් මිල :-

8. අතිරේක නියමයන් :- (අදාළ වට්ටම්)

කරුණාකර තත්කාර්ය සඳහා මේ සමග බහා ඇති මෙම තහවුරුකිරීමේ ලිපියේ පිටපත ලියා අත්සන් කර (පහත සඳහන් ලිපිනයට) අප වෙත ආපසු භාරදීම මගින් අදාල ප්‍රතිමිලදීගැනීමේ ගනුදෙනුවෙහි සඳහන් නියමයන් නිවැරදිව නිශ්චිතව දක්වනු ලබන බවට තහවුරු කරන්න.

අපගේ ෆැක්ස් අංකය : ....   අපගේ ටෙලෙක්ස් අංකය : ....

ලිපිලේඛන පිළිබඳ විමසීම සඳහා වන අපගේ දුරකථන අංකය;

ස්තුතිය,

....

සදහා සහ වෙනුවෙන්

(අලෙවිකරුගේ නම)

තහවුරු කිරීම මගින් .... (වෙළෙන්දාගේ නම) සමග ඇතුළත් වී ඇති ගනුදෙනුව නිවැරදි පිළිබිඹු වන බව මා/අප විසින් මෙයින් තහවුරු කර සිටිනු ලැබේ.

අත්සන් කලේ

....

(ගනුදෙනුකරු)

දිනය : ....